# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත

பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்

CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE




| මගේ අංකය / எனது இல. / My No. | CSS/7/5/6/1 | ඔබේ අංකය / உமது இல. / Your No. | | දිනය / திகதி / Date | 2015.07. 30 |
|---|---|---|---|---|---|

ප්‍රධාන ලේකම් උපදෙස් ලිපි (මුදල්) 10-2015

දකුණු පළාතේ සියළුම
ව්‍යවස්ථාපිත අධිකාරීන්/ආයතන ප්‍රධානීන් වෙත

**<u>උපදේශක සභා පිහිටුවීම සහ ආයතන සම්බන්ධීකරණ හා පසුවිපරම් කමිටු පිහිටුවීම</u>**

උක්ත කරුණ සම්බන්ධව රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කර ඇති 2015.05.19 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපිය සම්බන්ධයෙනි.(එම චක්‍රලේඛ ලිපියේ පිටපතක් මේ සමඟ අමුණා එවමි.)

02. එමඟින් ඉහත කරුණු වලට අදාළව නිකුත් කර ඇති 2000.03.30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2000 හා 2012.07.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි අංක 05/2012 කෙරෙහි අවධානය යොමු කර ඇත.

03. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2000හි පළවන ඡේදයේ විධිවිධාන පරිදි පිහිටුවා ඇති උපදේශක කාරක සභා සහ 2006.01.10 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණය අනුව පිහිටුවා ඇති ආයතන සම්බන්ධීකරණ සහ පසුවිපරම් කමිටු වල ක්‍රියාකාරීත්වයන්හි කිසියම් පසුබෑමක් තිබේ නම්, එම තත්ත්වය මඟහරවා අදාළ උපදේශක සභා සහ ආයතන සම්බන්ධීකරණ හා පසුවිපරම් කමිටු නිවැරදිව පවත්වාගෙන යාමට අවශ්‍ය කඩිනම් ක්‍රියාමාර්ග ගන්නා ලෙස දන්වා ඇති බැවින් එම චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

ඩබ්ලිව්.කේ.කේ.අතුකෝරල
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

පිටපත් :

| | | |
|---|---|---|
| 01. | ලේකම්,රාජ්‍ය පරිපාලන.....අමාත්‍යාංශය | : දැ.ගැ.ස. |
| 02. | සහකාර විගණකාධිපති, දකුණු පළාත | : දැ.ගැ.ස. |
| 03. | අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, දකුණු පළාත් සභාව | : දැ.ගැ.ස. |


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary : 091 2232343
කාර්යාලය / காரியாலயம் / Office : 091 2234052, 091 2226118
ෆැක්ස් / பெக்ஸ் / Fax : 091 2246299
විද්‍යුත් තැපෑල / மின்-அஞ்சல் / E-mail : chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இ தளம்: / Web site : www.cs.sp.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්.දහනායක මාවත, ගාල්ල.
Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.


"විශිෂ්ටත්වයෙන් ① ට එන යහපාලනයක්"